බාලවයස්කාරයෙකු ලිංගික අපයෝජනයට බඳුන් කිරීමක් කිසිසේත්ම සැහැල්ලුවෙන් නොසැලකිය යුතු වරදක් වේ. එසේ නම්, එවැනි වරදක් සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමේදී, එය සැහැල්ලු නොකොට දැක්වෙන භාෂා භාවිතයක් අවශ්‍ය නොවේ දැයි පාඨක අප ඇසිය යුතුයි.

එසේම, මාධ්‍ය මගින් ඉදිරිපත් කරනා භාෂාව, සමාජයේ චින්තනයද හැඩගැස්වීමට දායක වන බැවින්, යම් වෘත්තීන් නිෂේධනාත්මකව දැක්වෙන ඇතැම් අපහාසාත්මක යෙදුම් භාවිතය කෙතරම් යෝග්‍යදැයි ද පාඨක අප ඇසිය යුතුයි.

අරුණ (ජනවාරි 11, 2022), ලංකාදීප (පෙබරවාරි 01,2022). මව්බිම (පෙබරවාරි 03, 2022) සහ දිවයින (පෙබරවාරි 03,2022) පුවත්පත් තුළ පළ වූ ලිපි කිහිපයක සිරස්තල මෙහිදී උදාහරණ ලෙසින් ගත හැක.

අරුණ: "13 හැවිරිදි දැරියට හදි කල ටියුෂන් ගුරා කොටු"
ලංකාදීප: "සිසුවියට අමුතු ගණන් පාඩමක් ඉගැන්වූ ටියුෂන් ගුරා දැලේ"
මව්බිම: සිසුවියගේ ළැම අතපත ගෑ ටියුෂන් ගුරා රිමාන්ඩ් බාරයට
දිවයින: දැරියගේ ඇඟ ස්පර්ෂ කළ ටියුෂන් ගුරා රිමාන්ඩ්

1) "අමුතු ගණන් පාඩමක් ඉගැන්වීමක්" වශයෙන් බාලවයස්කාර දැරියක් හා සම්බන්ධ ලිංගික අතවරයක් දැක්වීම ඔස්සේ, ලිංගික අපයෝජනයක ඇති බරපතලකම සැහැල්ලු කොට දැක්වීමක් සිදු නොවන්නේ ද? ඒ ඔස්සේ, එවැනි සිදුවීම් සාමාන්‍යකරණය වීමටද සහායක් නොලැබෙනු ඇතිද?

2) ඉහත සිරස්තල තුළ සිදුවීම්වලට අදාළ අයවලුන් "ගුරා" යන යෙදුමෙන් හඳුන්වා තිබේ. එවැනි යෙදුම් කෙතරම් යෝග්‍ය වේයැයි ඔබ සිතන්නේ ද?